මැතිවරණ කොමිෂන් සභාව

**පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

**ආකෘතිය අංක 01**

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- **183**
ආයතනයේ නම :- **මැතිවරණ කොමිෂන් සභාව**

| කමිටුව විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු | | ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීමට ගන්නා ලද ක්‍රියාමාර්ග/ වත්මන් තත්ත්වය |
|---|---|---|
| 01. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය උපදෙස් මගේ අංක S/08/1/2022 හා 2022.11.17 දිනැති ලිපිය මඟින් ප්‍රධාන කාර්යාලයේ අංශ හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල සඳහා නිකුත් කර ඇත. 2022.12.31 දිනවන විට ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම අවසන් කරන ලෙස එමඟින් උපදෙස් දී ඇත. |
| 02. | හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොගැනීම. | හානි පිළිබඳ ලේඛනය මේ වන විට යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි. |
| 03. | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබීම. | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් පිළිතුරු ගෙන්වා ගෙන විගණන විමසුම් සඳහා පැහැදිලි කිරීම් සකස් කරන අවස්ථාවල ඇතැම් විට පිළිතුරු යැවීම ප්‍රමාදවන අවස්ථා ඇත. නමුත් හැකි සෑම අවස්ථාවකම නියමිත දිනට පෙර පිළිතුරු ලබාදීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. |
| 04. | වාහන ගර්භිතවී මාස 6කට වඩා අඩුකාලයකදී අපහරණය කර නොතිබීම. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ගර්භිත වාහන නියමිත කාලයට පෙර අපහරණ කටයුතු අවසන් කිරීමට නොහැකි වූ අතර මේ වනවිට සියලුම ගර්භිත වාහන අපහරණ කටයුතු අවසන් කර ඇත. |
| 05. | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම් පිළිබඳව පරීක්ෂාවක් සිදුකර නොතිබීම. | කොවිඩ් 19 වසන්ගත තත්ත්වය හේතුවෙන් වාහනවල ඉන්ධන දහනයවීම පිළිබඳ පරීක්ෂාවක් කිරීමට නොහැකි වූ අතර 2022 වර්ෂයේ ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවක් සිදු කිරීමට සැලැසුම් කර තිබුණත් වාහන සඳහා ඉන්ධන සීමා පැනවීම නිසා චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට නොහැකිවිය. කඩිනමින් අදාල පරීක්ෂාවන් සිදු කිරීමට කටයුතු කරමි. |
| 06. | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර නොතිබීම. | සේවය අතහැර ගිය පහත සඳහන් නිලධාරිගේ ණය ශේෂ අයකර ගැනීමට ඇත.<br>1. ඩී.අයි. ලියනගේ 97110<br>2. ආර්. නාගරත්නම් 119170<br>3. එම්.පී.එස්.එච්. ඩයස් 202660<br>මෙම ණය ශේෂ කඩිනමින් අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු යොදා ඇත. |

| | | |
|---|---|---|
| 07. | අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබීම. | අනුමත සංඛ්‍යාව ඉක්මවා නිලධාරින් බඳවාගෙන නොමැත. |
| 08. | ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබීම. | තිරසර සැකැස්ම මේ වනවිට සකස් කර ඇත. |
| 09. | හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක ලඟාකර ගැනීම මැන බැලීම සඳහා කාර්යය සාධන ඉලක්ක නියම කර නොතිබීම. | මේ වනවිට හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක ලඟා කර ගැනීම මැන බැලීම සඳහා කාර්ය සාධන ඉලක්ක නියම කර ඇත. |
| 10. | ආයතනයේ තිරසර අරමුණු ඉලක්ක ලඟාකර ගැනීමට අදාලවන නිශ්චිත පාර්ශව හඳුනාගෙන නොතිබීම. | මේ වනවිට ආයතනයේ තිරසර අරමුණු ඉලක්ක ලඟාකර ගැනීමට අදාලවන නිශ්චිත පාර්ශව හඳුනාගෙන ඇත. එම පාර්ශව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් සඳහා ද ඇතුලත් කර ඇත. |
| 11. | තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යාංශයේ 2018.04.27 දිනැති අංක MSDW/08/65 දරන චක්‍රලේඛ විධිවිධාන අනුව ඉටුකල යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කල යුතු නියෝජිතයින් දෙදෙනා පිළිබඳ විස්තර තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබීම. | ඉටුකල යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පහත සඳහන් නිලධාරින් පත්කර ඇත.<br>ඉඳුනිල් බණ්ඩාර මයා - සහකාර මැතිවරණ කොමසාරිස්(පාලන)<br>සන්ධ්‍යා දීපිකා මිය - පරිපාලන නිලධාරි |
| 12. | සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අතිරේක පුහුණුවක් නියම කර නොතිබීම. | 2023 වර්ෂය වෙනුවෙන් සකස් කරනු ලබන මානව සම්පත් සැලැස්මට එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අතිරේක පුහුණුවක් ලැබෙන ලෙස සකස් කිරීමට කටයුතු කරමි. |
| 13. | සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුලත්ව කාර්යය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | කාර්යය මණ්ඩලය වෙත රාජකාරි පැවරීමේ ලිපි ලබාදී ඇත. සියලුම කාර්යය මණ්ඩලයට අදාලව කාර්යය සාධන ගිවිසුම් ගතවී නොතිබුනත් වාර්ෂිකව මාණ්ඩලික නිලධාරීන් වෙනුවෙන් කාර්යය සාධන ගිවිසුම් ගතවී ඇත. |
| 14. | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ වීම. | ඉදිරි වර්ෂවලදී අඩුපාඩු හා දෝෂ අවම වන පරිදි කටයුතු කර හොඳ මට්ටමක විගණන මතයක් ලබා ගැනීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| 15. | අයවැය චක්‍රලේඛයට අනුව අවම වශයෙන් නිමැවුම් දර්ශක තුනක් හඳුනාගෙන ලේඛනගත කර නොතිබීම. | නිමවුම් දර්ශක හඳුනාගෙන ලේඛනගත කිරීමට පියවර ගෙන ඇත. |
| 16. | ආයතනය විසින් ඉටුකරනු ලබන කාර්යය භාරය හා සම්බන්ධිතව ප්‍රධාන කාර්යය දර්ශක 03ක් හඳුනාගෙන නොතිබීම. | කොමිෂන් සභාව විසින් ඉටුකරනු ලබන කාර්යය භාරය සම්බන්ධිත ප්‍රධාන කාර්යය දර්ශක හඳුනාගෙන ඇති අතර එම දර්ශක උපාය මාර්ගික සැලැස්මට ඇතුලත් තර ඇත. ප්‍රධාන කාර්යය දර්ශක වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කිරීමට පියවර ගෙන ඇත. |
| 17. | හඳුනාගත් පලමු දර්ශකයේ ලගාවීම 50% වඩා අඩුවීම හඳුනාගත් දෙවන දර්ශකයේ ලගාවීම 50% වඩා අඩුවීම හඳුනාගත් තුන්වන දර්ශකයේ ලගාවීම 50% වඩා අඩුවීම. | කොවිඩ් 19 වසංගත තත්ත්වය 2020 වර්ෂයේ හඳුනාගත් කාර්යය දර්ශකවල ලඟාවීමේ ප්‍රගතිය 50% වඩා අඩුවීමට හේතුවූ අතර 2023 වර්ෂයේදී උපරිම ලගාවීමේ ප්‍රගතියක් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමි. |
| 18. | විගණකාධිපතිවරයා විසින් ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු/ දෝෂ නිවැරදි කරවාගෙන නොතිබීම. | විගණකාධිපතිවරයා විසින් පෙන්වා දෙනු ලබන අඩුපාඩු/ දෝෂ නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් හා ක්‍රියාමාර්ග සියලුම නිලධාරින් වෙත ලබා දී ඇත. |

**ප්‍රධාන ගණන්දීමේ නිලධාරි**

නම:- **සමන් ශ්‍රී රත්නායක**

තනතුරු:- **මැතිවරණ කොමසාරිස් ජනරාල්**

දිනය:- 2023.01.30